## කැලණිය විශ්වවිද්‍යාලය - 2014

කැලණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2015 ජුනි 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් **31** දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ අයිතම සාධාරණ වටිනාකම් ධාරණ අගයට සාපේක්ෂව සැලකිය යුතු තරම් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත් 2014 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.648,301,674 ක් ලෙස දක්වා ඇති විශ්වවිද්‍යාලයේ ඉඩම් වසර ගණනාවකින් තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන ඉඩම් කැබලි 11 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහපොල භාර අරමුදලින් ලද බැරකර තිබූ රු. 9,097,900 ක් හා විවිධ බැංකු ගිණුම් සඳහා බැර කරන ලද රු.996,044 ක් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට වෙනත් ගෙවිය යුතු ගිණුමට බැර කර තිබුණි.

#### 2.2.3 ගෙවිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවකට පෙර ආරක්ෂක ගිවිසුම් අත්සන් කිරීමේදී ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල් රු.82,441 ක් 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු තැන්පත් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත් මෙම මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>**(i)** මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂයේදී හා 2012, 2013 වර්ෂවලදී ගෙවා ඇති දැනට නිමවූ පර්යේෂණ සහ ජාත්‍යන්තර සමුළු වලට අදාල එකතුව රු.823,522 ක් වූ අත්තිකාරම් 2015 ජුලි 20 වන විටත් පියවා නොතිබුණි. |
| | **(ii)** මුදල් රෙගුලාසි 757 (2) | ජංගම නොවන වත්කම් සමීක්ෂණයේදී අනාවරණය වූ අයිතම 148 ක ඌනතාවයන් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අදාල ඉදිරි පියවර ගැනීමට සහ ලේඛනගත නොවූ භාණ්ඩ අයිතම 215ක් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි **XX** වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ **X** පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.916,236,438 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් සමීක්ෂණය කර නොතිබුණු අතර 2012 වර්ෂයේදී පුස්තකාල පොත් සමීක්ෂණය කරන ලද බව වාර්තා කර තිබුණද, සමීක්ෂණ වාර්තා 2015 මැයි දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු වුවත් කැළණිය විශ්වවිද්‍යාලයේ ධාවන තත්ත්වයේ පවතින වාහන 30 කින් වාහන 24 ක ඉන්ධන දහනය සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂාකර නොතිබුණි. |
| (ඊ) | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 සහ 2014 ජුලි 24 දිනැති අංක 06/2014 (i) දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි | ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට **"සංග්‍රහ වියදම් සඳහා ගෙවීම්"** ලෙස නිලධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 8 සිට සියයට 20 දක්වා ප්‍රතිශතයක් මාසිකව ගෙවීමට තීරණය කර රු.567,709 ක මුදලක් ගෙවා තිබුණි. වැටුප් පදනම් කර දීමනාවක් ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබීම හේතුවෙන් එය වැටුප් විෂමතාවයන් කෙරෙහිද බලපා ඇති බව නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**122,261,416** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.226,857,577 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.104,596,161 කින් අඩුවීමට ආයෝජන පොලී ආදායම් රු.35,576,050 කින් අඩුවීම හා ගිවිසුම්ගත සේවා වියදම් සහ වෙනත් පුනරාවර්තන වියදම් රු.91,748,226 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

**(i)** දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ 2012/2013 අධ්‍යයන වර්ෂයෙහි ශාස්ත්‍රවේදී, ව්‍යාපාර කළමනාකරණවේදී හා වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සඳහා ශිෂ්‍යයින් 27,860 ක් ලියාපදිංචි වී තිබුණු අතර 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා 2015 ජුලි 30 දක්වා උපාධි අපේක්ෂකයින් ලියාපදිංචි කර ගෙන නොතිබුණි.

**(ii)** 2013 වර්ෂයේදී උපාධි ප්‍රදානෝත්සව පවත්වා නොතිබුණු අතර පාඨමාලා 05 ක් සඳහා 2011 සහ 2012 වර්ෂවල උපාධිලාභීන් පිළිවෙළින් 3,675 ක් හා 4,470 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය 4,630 ක් විය.

**(iii)** විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පරීක්ෂණ (බාහිර) , පැරණි හා නව නිර්දේශය යටතේ 2009,2010 සහ 2011 වර්ෂ සඳහා 2015 ජූලි 20 දින වන විටද විභාග පවත්වා නොතිබුණි.

(ආ) පර්යේෂණ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** අභ්‍යන්තර පර්යේෂණ ආධාර ලෙස ඒකාබද්ධ අරමුදලින් 2014 වර්ෂය සඳහා එක් පීඨයකට රු.මිලියනය බැගින් රු.මිලියන 06 ක් ප්‍රතිපාදනය කර තිබුණි. 2014 වර්ෂය සඳහා පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණ ව්‍යාපෘති 16 ක් අනුමත කර තිබුණු අතර මෙයින් පර්යේෂණ 02 ක් ආරම්භ කර නොතිබුණි. ඒ අනුව ආචාර්යවරුන් 14 දෙනෙකු සඳහා රු.4,199,825 ක මුදලක් අනුමත කළද සමාලෝචිත වර්ෂය තුලදී එයින් රු.1,400,156 ක් පමණක් උපයෝජනය කර ගෙන තිබූ අතර එයින් දෙදෙනෙකු ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මසයේ 30 හා 31 දිනවල පවත්වන ලද පර්යේෂණ පරිසංවාදය සඳහා පර්යේෂණ සාරාංශ වාර්තා (Research Abstracts ) 125 ක් ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා සමාජ විද්‍යා පීඨයෙන් වාර්තා 44 ක්ද, මානව ශාස්ත්‍ර පීඨයෙන් වාර්තා 28 ක්ද ආදි වශයෙන් ඉදිරිපත් කර තිබුණද වාණිජ හා කළමනාකරණ පීඨයෙන් එක් සාරාංශ වාර්තාවක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමට අනුව පර්යේෂණ නිර්ණායකයන් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර ලෝක ශ්‍රේණිගත කිරීම අනුව කැලණිය විශ්වවිද්‍යාලය 2014 ජූලි වන විට 3,194 තත්ත්වයේ පැවතියද 2015 ජනවාරි වන විට 3,087 දක්වා වර්ධනය වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපාර පරිපාලනපති (MBA) පාඨමාලාවට අදාලව ඉන්දියාවේ පැවැති ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා 2012 දෙසැම්බර් 14 දින ආචාර්යවරියක් වෙත ගෙවූ රු.250,000 ක අත්තිකාරම් මුදල පියවීම සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත්‍රවල සංඛ්‍යාත්මක වෙනස් කිරීම් කර ඇති හෙයින් වාණිජ හා කළමනාකරණ පීඨයේ පීඨාධිපති විසින් පියවීම් වවුචරය නිර්දේශ කර නොතිබුණි. අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් යම් මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු වී තිබුණ බවට වාර්තා වී වසර 02 ට අධික කාලයක් ගත වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ **XXII** වැනි පරිච්ඡේදය ප්‍රකාර විනය පරීක්ෂණයක් හෝ මූලික පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) රාගම වෛද්‍ය පීඨය පිහිටා තිබෙන රජයට අයත් හෙක්ටයාර් 13.62 ක් වන ඉඩමෙහි අයිතිය 2015 ජූලි 20 වන විටද විශ්වවිද්‍යාලයට පවරා ගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම් හා බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.13,229,365 ක් අය කරගෙන නොතිබුණු අතර එක් ආචාර්යවරයෙකුගේ පමණක් අර්ථ සාධක අරමුදල් ශේෂයෙන් රු.395,760 ක් අයකර ගෙන තිබුණි.

(ඈ) 2007 වර්ෂයේ රු.88,250 කට මිලදී ගෙන සවි කරන ලද ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) 2010 සැප්තැම්බර් සිට ක්‍රියා විරහිතව පැවතුණ අතර නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් විගණිත දිනය වූ 2015 ජූලි 20 දක්වාම අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පාලක සභා අනුමැතියක් සහිතව විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලක් පිහිටුවා තිබියදී සමාලෝචිත වර්ෂයේදී පොදු සංචිතයෙන් රු. 67,699,341 ක් විශ්වවිද්‍යාල වැඩිදියුණු කිරීමේ අරමුදල නමින් විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලේ අරමුණු හා සමාන නව අරමුදලකට බැර කර තිබුණි.

### 4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2014 සැප්තැම්බර් වනවිට පුස්තකාල පොත් 35,159 ක් අස්ථාන ගත වී ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාල බලධාරීන් වෙත වාර්තා කර මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දින වනවිට පශ්චාත් උපාධි, සාමාන්‍ය උපාධි අපේක්ෂක සිසුන් සහ ආචාර්යවරුන් විසින් ලබාගෙන වසර 5 කට අධික කාලයක් තුළ ආපසු භාර නොදුන් පොත් 1231 ක් සම්බන්ධයෙන් මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විගණිත දිනය දක්වාම කටයුතු කර නොතිබුණු, අතර උපාධි සහතිකද පිරිනමා තිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව හා ත්‍යාග පිරිනැමීම සඳහා වූ අරමුදල් ගිණුම් 19 කට අදාලව එකතුව රු.4,680,789 ක් වූ පොලී ආදායම් උපයෝගී කර ගෙන පසුගිය වර්ෂ 6 ක කාලපරිච්ඡේදය තුළ කිසිදු ශිෂ්‍යත්ව හෝ ත්‍යාග පිරිනමා නොතිබුණි.

(ඇ) මුදල් කමිටුවේ නිර්දේශ හෝ පාලක සභා අනුමැතියකින් තොරව පීඨාධිපතිතුමියගේ උපදෙස් මත ආබාධිත ව්‍යාපෘති අරමුදලින් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේ රු.1,500,490 ක් ආබාධිත ළමුන් සඳහා ඉදිකරනු ලබන නව ගොඩනැගිලි ගිණුමට බැර කර තිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලේ 2014 වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙනා රු.6,939,745 ක ශේෂයක් තිබූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.2,000,000 ක් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණු අතර එම වර්ෂය ඇතුළත දරා ඇති මුළු වියදම වනුයේ රු.1,520,750 ක් පමණි. ඒ අනුව වර්ෂයේ දරා තිබූ වියදම අරමුදලේ ශේෂයෙන් සියයට 17 ක් පමණක් වූ බැවින් ඌණ උපයෝජන මට්ටමක පැවති බව නිරීක්ෂණය කෙරේ. සමාලෝචිත වර්ෂය අවසානයේදී කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල යටතේ මූල්‍ය ප්‍රකාශනවල රු.7,418,994 ක ශේෂයක් පැවතුණි.

## 4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 101 ක්ද, අනධ්‍යයන අංශයේ පුරප්පාඩු 112 ක්ද වූ අතර එම පුරප්පාඩු පිරවීමට මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 08 ක් වෙනුවෙන් ස්ථිර කාර්ය මණ්ඩලය පත් කිරීමට කටයුතු නොකර පැවැරුම් පදනම මත විශ්‍රාමික සේවකයින් බඳවා ගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ලඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන අරමුණු 05 ක් අංශ 06 ක් යටතේ දක්වා තිබුණි. එම අංශ 06 හි මුළු ක්‍රියාකාරකම් 481 ක් දක්වා තිබූ අතර එහි ප්‍රගතිය සලකා බැලීමේදී මුළු ක්‍රියාකාරකම්වලින් සියයට 18 ක් පමණක් නිමවී තිබූ අතර සියයට 25 ක් දැනට නිමවෙමින් පැවතුණි. ඒ අනුව මේ වනවිට ආරම්භ නොකළ ක්‍රියාකාරකම් ගණන සියයට 57 ක් විය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ විධිමත් අනුමැතියක් සහිතව සංශෝධිත අයවැය ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) පුස්තකාල පාලනය
(ඇ) වාහන පාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) අත්තිකාරම් පාලනය